| | | |
|---|---|---|
| 5 ශ්‍රේණිය | වලස්මුල්ල අධ්‍යාපන කලාපය.<br>දෙවන වාර පරීක්ෂණය - 2018<br>**බුද්ධාගම** | කාලය පැය 1 යි. මි. 30 යි. |

නම -..........................................................................................

පාසල..........................................................................................

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. **පහත සඳහන් ප්‍රකාශ හරිනම් ✓ ලකුණද වැරදිනම් × යොදන්න.**

1. මිනිසත්බව ලැබීම දුර්ලභ අවස්ථාවකි. ( )
2. මෛත්‍රී කරන පුද්ගලයා කාටත් ප්‍රියජනක වෙයි. ( )
3. අනගාරික ධර්මපාලතුමා සිංහල බෞද්ධයා නම්, පුවත්පත ආරම්භ කරන ලදී ( )
4. යශෝධරා දේවිය, සුද්ධෝදන රජතුමා ඇතුළු පිරිසට බුදුන් වහන්සේ ධර්මපාල ජාතකය දේශනා කළ සේක. ( )
5. ආහාර ගැනීමේ දී ඇඟිලි ලෙව කෑම හා තොල ලෙව කෑම නරක පුරුද්දකි. ( )
6. මිත්‍රයෙකුට කරදරයක් වූ විට ඔහු හැර දමා යාම කළණ මිතුරෙකුගේ ක්‍රියාවකි. ( )
7. බුදු ගුණ සිහි කිරීම බුද්ධානුස්සති භාවනාව නම් වේ. ( )
8. සෝමාවතී දාගැබ පිහිටා ඇත්තේ පොළොන්නරුවේය. ( )
9. මෛත්‍රියෙන්ම වෛරය සන්සිදේ යනු බුදු වදනක්ය. ( )
10. සෝණ හාමුදුරුවන් ගිහි කළ දක්ෂ විණා වාදකයෙකි. ( )
11. ස්වාමීන් වහන්සේලා ඇසුරු කිරීම හොඳ පුරුද්දකි. ( )
12. කළ කෝලාහල කරන අයත් සමග අප ද කළ කෝලාහල කළ යුතුය. ( )
13. අක්කෝස බමුණා බුදුන් වහන්සේ හමු වීමට පැමිණියේය. ( )
14. සෝමාවතී දාගැබේ දකුණු දළදා වහන්සේ නිදන් කර ඇත. ( )
15. වෙසක් පොහොය දිනය නිවාඩු දිනයක් බවට පත් කිරීමට ඕල්කට් තුමා මූලික විය. ( )

(2 ×15= 30)

2. **ගැළපෙන සේ යා කරන්න.**

| | | |
|---|---|---|
| 1. | පව් සිතුවිලි | නො සන්සිඳේ |
| 2. | ඉවසීම හා කම්පා නොවීම | තාදී ගුණය |
| 3. | බුද්ධෝ | දූවිලි වගෙයි |
| 4. | වෛරයෙන් වෛරය | මානස විල පාඩමෙන් හෙළි වෙයි |
| 5. | කළණ මිතුරු අගය | බුදු ගුණයකි |

(2×5=10)

3. **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. බුදුන් වහන්සේට පරුෂ වචනයෙන් බැන වැදුණේ
   i. වටු වැද්දා   ii. අක්කෝස බ්‍රාහ්මණයා
   iii. කාලුදායි ඇමතියා   iv. සෝණ හිමියන්

2. දුටුගැමුණු රජතුමාගේ පියා වූයේ,
   i. ගිරි අභය කුමරු   ii. කැලණි තිස්ස රජු
   iii. කාවන් තිස්ස රජු   iv. ශිව රජතුමා

3. මෙත් වැඩීමේ ආනිශංසයක් නොවන්නේ
   i. හිත සන්සුන් වීම   ii. නපුරු හීන දැකීම
   iii. ප්‍රසන්න බාවය වැඩිවීම   iv. හිත කලබල නොවීම

4. ජීවිතයේ වටිනාකම බුදුන් වහන්සේ පහදා දුන්නේ
   i. විශාඛාවට   ii. සෝමා දේවියට
   iii. රජ්ජුමාලාට   iv. සෝණ හිමියන්ට

5. පියාගේ මසුරුකම නිසා මරණයට පත් වූයේ
   i. සුනීත   ii. සෝපාක   iii. රජ්ජුමාලා   iv. මට්ටකුණ්ඩලී

(2×5=10)

4. **හිස්තැනට සුදුසු පිළිතුරු තෝරා ලියන්න.**

(මානස විල, මිගෙට්ටු වත්තේ ගුණානන්ද, ආනාපාන සති, අම්පාර ඕල්කට්)

1. හුස්ම ගැනීම හා හෙළීම ........................................................................ භාවනාවයි.
2. දීඝවාපිය අයත් වන්නේ ........................................................................ දිස්ත්‍රික්කයටය.
3. බෞද්ධ දහම් පාසල් ආරම්භ කිරීමට ........................................................ මහතා මූලික විය.
4. ........................................................හිමියෝ පංච මහා වාදයට මූලිකත්වය ගත්හ.
5. හොඳ මිතුරු ගුණය ........................................................................පාඩමෙන් හෙළිවෙයි.

(2×5=10)

5. **පහත සඳහන් කියමන් කිව්වේ කවුද ? කාටද ?**

1. අක්කේ, ඒ ළමයි දහම් පාසල් යන්නේ නැතිව ඇති නේද?

 i ..............................................................................................

 ii ..............................................................................................

2. වෙනදා නොලැබුනු රසවත් කෑමක් කොහෙන්ද ලැබුණේ.........

 i ..............................................................................................

 ii ..............................................................................................

3. මහ රජතුමනි, මා සමඟ යශෝධරාවගේ කුටියට යමු.

 i ..............................................................................................

 ii ..............................................................................................

4. අනේ සීයේ, බලන්නකෝ අයියා මගේ පෑන උදුර ගත්තා

 i ..............................................................................................

 ii ..............................................................................................

5. දරුවා, රජ්ජුමාලා ඔබ මොකද කරන්න හදන්නේ,

 i ..............................................................................................

 ii ..............................................................................................

(2×5=10 )

6. **පහත කවිය සම්පූර්ණ කරන්න.**

1. වැඩිහිටි බසකට වාද නො ගන්නෙමි

 සැමටම බුදු වදනින් අමතන්නෙමි

 ..............................................

 ..............................................

(3×2=6 )

7. **පිළිතුරු ලියන්න.**

1. කළණ මිතුරන් සතු ගුණාංග 2 ක් ලියන්න.

i ..............................................................................................

ii ..............................................................................................

(2×2=4)

2. බුදු ගුණ 3 ක් නම් කරන්න.

i ..............................................................................................

ii ..............................................................................................

iii ..............................................................................................

(2×3=6)

3. පන්සලෙන් අපට ඉටුවන සේවාවන් 2 ක් ලියන්න.

i ..............................................................................................

ii ..............................................................................................

(2×2=4)

4. ඕල්කට් තුමාගෙන් මෙරටට සිදු වූ සේවාවන් 2 ක් ලියන්න.

i ..............................................................................................

ii ..............................................................................................

(2×2=4)

5. බෞද්ධ කොඩිය ඇඳ පාට කරන්න.

(1×6=6)

## 5 ශ්‍රේණිය බුද්ධාගම

### පිළිතුරු පත්‍රය

1.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | ✓ | 2. | ✓ | 3. | ✓ | 4. | × |
| 5. | ✓ | 6. | × | 7. | ✓ | 8. | ✓ |
| 9. | ✓ | 10. | ✓ | 11. | ✓ | 12. | × |
| 13. | × | 14. | ✓ | 15. | ✓ | | |

2.
1. දූවිලි වගෙයි
2. තාදී ගුණය
3. බුදු ගුණයකි
4. නොසන් සිළේ
5. මානස විල පාඩමෙන් හෙළිවෙයි

3.
1. ii
2. iii
3. ii
4. iii
5. iv

4.
1. ආනාපාන සති
2. අම්පාර
3. ඕල්කට් තුමා
4. මිගෙට්ටුවත්තේ ගුණානන්ද
5. මානස විල

5.
1. මල්ලී අක්කාට
2. රජ හංසයා හංස පිරිසට
3. බුදුන් වහන්සේ සුද්ධෝධන රජුට
4. නයනා සීයාට
5. බුදුන් වහන්සේ රජ්ජුමාලාට

6. ලද උපකාරෙට තුති පුද දෙන්නෙමි
මම හොඳ දරුවෙකු ලෙස හැසිරෙන්නෙමි.

7.
1. මෙම ප්‍රශ්න වලට පිළිතුරු
2. නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
3.
4.
5.